
# 18. ශුද්ධ බයිබලය

ශුද්ධ බයිබලය කිතුනු අපගේ පූජනීය ග්‍රන්ථය යි. චිත්‍රයේ දැක්වෙන ලෙස ශුද්ධ බයිබලය අතීතයේ දී එකම ග්‍රන්ථයක් සේ සකස් වී නොතිබුණි. වර්තමානයේ ශුද්ධ බයිබලයේ පිටපත් ගණනාවක් අප අතට පත් වී ඇත. දෙවියන් වහන්සේ තෝරාගත් ඉශ්‍රායෙල් ජනතාවගේ ඉතිහාසය ඔවුන්ගේ ජීවිත ගමන තුළ ලත් අත්දැකීම් හා සම්බන්ධ තොරතුරු රාශියක් පළමුව ආරක්ෂා වූයේ ඔවුන්ගේ ජන කොටස තුළ වාචිකව ය.




18:1 රූපය - ශුද්ධ බයිබලය

මෙසේ පරපුරෙන් පරපුරට කට වචනයෙන් දායාද වී ඒවා ලේඛන ගත කරන ලද්දේ අවුරුදු 1200 ක පමණ කාල පරිච්ඡේදයක් තුළ ය. ශුද්ධ බයිබලයේ අන්තර්ගත ව ඇති සියල්ල දේව වචනය බව පිළිගනිමු. එහි ප්‍රධාන කර්තෘ ද දෙවියන් වහන්සේ ය. උන්වහන්සේගේ ආනුභාවය තුළින් එය ලියන ලද්දේ මිනිස් කතුවරු විසිනි. පළමුවෙන් ම දේව වචනය ලියවුණේ 'පැපිරස්' නම් කොළවලින් සාදාගත් "ස්ක්‍රෝල්" නමින් ව්‍යවහාර කළ හැකුළුම් පත්වල ය. සතුන්ගේ හම් හා ගල් පුවරුවල ලියැවුණු ශුද්ධ ලියවිලි ආරක්ෂා කර ගැනීමට එකළ විවිධ ක්‍රම යෙදූහ. මුලින් ම හෙබ්‍රෙව් භාෂාවෙන් ලියැවුණු ශුද්ධ ලියවිලි පසුව ග්‍රීක හා භාෂා ගණනාවකට පරිවර්තනය වී ඇත.

**බයිබලය** යන වචනය බිඳී ආවේ '**බිබ්ලියොත්**' යන ග්‍රීක වචනයෙනි. එහි අර්ථය පොත් ගණනාවක එකතුවක් යන්නයි. පොත් ගණනාවක් ඇතුළත් ශුද්ධ බයිබලය පුස්තකාලයක් ලෙස ද අපට පිළිගත හැකි ය.



18 රූපය - ස්ක්‍රෝල් පත්

කතුවරු ගණනාවක් විසින් සම්පාදිත වූ මෙම උතුම් ග්‍රන්ථයෙහි ඉතිහාස කතා, නීති මාලා, රාජ්‍ය පාලනය, දිවැසිවර ප්‍රකාශන, පැවති විශ්වාස, සාහිත්‍යය, දේව අවවාද අනුශාසනා ඇතුළත් ය.


ශුද්ධ බයිබලය කොටස් (කාණ්ඩ) දෙකකින් යුක්ත වේ. ඒවා නම් පුරාණ ගිවිසුම හා නව ගිවිසුම ය. දෙවියන් වහන්සේ විසින් විශ්වය මැවීමේ පුවතින් ඇරඹෙන තොරතුරු පුරාණ ගිවිසුමෙහි විස්තරාත්මක ව ලියැ වී ඇත.

නව ගිවිසුමෙහි, ක්‍රිස්තුස් වහන්සේගේ උපත, උන්වහන්සේ පිළිගැන්වූ ශුභාරංචි සේවය හා මුල් සභා ඉතිහාසය පැහැදිලි ව ලියැවී ඇත. එම නිසා දේව වචනය අපට අනාවරණය කරන ශුද්ධ බයිබලය අපගේ උතුම් ම එකම පූජනීය ග්‍රන්ථය ලෙස ගෞරවාදරයට පත් විය යුතු වේ.

හෙබ්‍රෙව් බසින් පළමුවෙන් ම ලියැවුණ පුරාණ ගිවිසුම ග්‍රීක භාෂාවට පරිවර්තනය විය. ජේසුස් වහන්සේගේ කාලයට පසු නව ගිවිසුම ලියන ලද්දේ ග්‍රීක බසිනි. ඊට හේතුව පලස්තීන දේශය රෝම අධිරාජ්‍යයට යටත් ව තිබූ නිසා ග්‍රීක භාෂාව ප්‍රචලිත ව පැවතීම ය. මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීමෙන් අනතුරු ව එකම ග්‍රන්ථයක් ලෙස ශුද්ධ බයිබලය අප අතට පත් වී ඇත. ලෝකවාසි, විවිධ භාෂා කතා කරන ජනතාවට ස්ව භාෂාවලින් ම බයිබලය කියවීමට අවස්ථාව උදා වූයේ සීග්‍රයෙන් පරිවර්තන ක්‍රියාවලිය සිදු වූ නිසා ය. අද ලෝකයේ වැඩි වශයෙන් ම පරිවර්තනය වී ඇති ග්‍රන්ථය ශුද්ධ බයිබලය බව පිළිගැනේ.

**අපි දැන් ශුද්ධ බයිබලයේ ග්‍රන්ථ සැකසුම වෙත යොමු වෙමු.**

කාණ්ඩ දෙකකින් යුත් බයිබලයෙ හි **පුරාණ ගිවිසුම** පොත් **තිස් නවයකින්** ද **නව ගිවිසුම** පොත් **විසි හතකින්** ද සමන්විත ය. පුරාණ ගිවිසුමෙහි මුල් පොත් පහ පංච පුස්තකය ලෙස හැඳින් වේ. මෙහි ඉශ්‍රායෙල් ඉතිහාසය හා එම ජනතාව ලත් ජුදෙව් ව්‍යවස්ථාව (නීතිය) ඇතුළත් වේ. දෙවන පොත වන 'නික්මයාම' යන්නෙහි මිසර දේශයෙහි පදිංචිව එහි දී වහල්කමට පත් වූ ඉශ්‍රායෙල් ජනතාව, නිදහස කරා ගිය ගමන සවිස්තර ව ලියැ වී ඇත. දිවැසාවලියට අයත් ලියවිලි තුළින් දෙවියන් වහන්සේ විවිධ අවස්ථාවන් හි දිවැසිවරු කැඳවා ජනතාවට දුන් දේව පණිවුඩ සඳහන් වේ. ඓතිහාසික තොරතුරු හා සාහිත්‍ය ශෛලීන් ලියවිලි පොත් කාණ්ඩයට ඇතුළත් වන අතර, දානියෙල් ලත් අනාවරණයන් ද මෙහි සඳහන් වේ.




18:3 රූපය - ශුද්ධ බයිබලය

නව ගිවිසුමට අයත් මුල් පොත් සතර ශුභාරංචි පොත් ලෙස හැඳින් වේ. ශුභාරංචි පොත්වල අඩංගු වන්නේ, ජේසුස් වහන්සේගේ ජීවිතය පිළිබඳ තොරතුරු, ජනතාවට කළ සේවය, දුක් විඳීම, මරණය උත්ථානය හා සබැඳි කිතුනු අනුගාමිකයන් දත යුතු වටිනා තොරතුරු ය. ඉන් අනතුරු ව ඇති ක්‍රියා පොත  මුල් කිතුනු සභාවේ ඉතිහාසය ද සන්දේශ හෙවත් හසුන්පත් යනුවෙන් හඳුන්වන ලිපිවල සභාවලට අවවාද අනුශාසනා ද ඉදිරිපත් කර ඇත. මේවායින් වැඩි කොටසක් පාවුල්තුමා ලියා ඇති අතර, අද පවා කිතුනු සභාවන්ට හා අපට ද අගනා උපදෙස් හා මග පෙන්වීම් ඒවායින් ලබාගත හැකි ය. ජේසුස් වහන්සේගේ ලොව පහළ වීම පිළිබඳ අනාවැකි, පුරාණ ගිවිසුමේ දිවැසිවර ප්‍රකාශන මගින් අනාවරණය වේ. උන්වහන්සේ පුරාණ ගිවිසුමේ ශුද්ධ ලියවිලි අධ්‍යයනය කළ සේක. නාසරෙත්හි පළමු දේශනයට උන්වහන්සේ  තෝරා ගත්තේ යෙසායා දිවැසිවරයාගේ ග්‍රන්ථයෙනි. ජුදෙව් ව්‍යවස්ථාව මනාව දැන සිටි ජේසුස් වහන්සේ ජුදෙව් ආගමික නායකයින් හමුවෙහි ප්‍රකාශ කළේ උන්වහන්සේ ව්‍යවස්ථාව සම්පූර්ණ කරන්නට වැඩිය බව ය. ජේසුස් වහන්සේ තම පරීක්ෂාවලට ප්‍රතිචාර දීමට යොදා ගනු ලැබුවේ ද පුරාණ ගිවිසුමේ ශුද්ධ ලියවිලි ය.

මේ අනුව බලන කළ එදා ජේසුස් වහන්සේ මෙන්, කිතුනු අනුගාමිකයන්ට ශුද්ධ බයිබලය වටිනා පූජනීය ග්‍රන්ථය වේ. එහි ලියැවී ඇති දේව වචනය කුඩා කල පටන් කියවීමටත් නිසි ලෙස වටහා ගැනීමටත් උත්සාහ කළ යුතු ය. අපගේ ජීවිතයට නිවැරදි, යහපත් දේ හඳුනා ගැනීමට ඉන් මග පෙන්වීම ලැබේ. දේව දරුකම ලොවට හුවා දැක්වීමට ඉන් ලැබෙන ධෛර්යය හා ශක්තිය වචනයෙන් කියා නිම කළ නොහැක.

# ශුද්ධ බයිබලය

## පුරාණ ගිවිසුම

### නීති පොත්
1. උත්පත්ති
2. නික්මයාම
3. ලෙවී ව්‍යවස්ථාව
4. ගණන් කතාව
5. ද්විතිය නීති සංග්‍රහය

### දිවැසාවලිය

#### පෙර
1. ජොෂුවා
2. විනිසුරුවරු
3. I සාමුවෙල්
4. II සාමුවෙල්
5. I රාජාවලිය
6. II රාජාවලිය

#### පසු

##### ප්‍රධාන
1. යෙසායා
2. ජෙරමියා
3. එසකියෙල්

##### සුළු
1. හොසියා
2. ජෝවෙල්
3. ආමොස්
4. ඔබදියා
5. ජෝනා
6. මීකා
7. නාහුම්
8. හබකුක්
9. ශෙපනියා
10. හග්ගයි
11. සෙකරියා
12. මලාකි

### ලියවිලි

#### සාහිත්‍ය
1. රූත්
2. එස්තර්
3. ගීතාවලිය
4 ජෝබ්
5. හිතෝපදේශ
6. ප්‍රේම ගී
7. ධර්මෝපදේශකයා
8. විලාප ගී

#### ඉතිහාසය
1. i වංශාවලිය
2. ii වංශාවලිය
3. එස්රා
4. නෙහෙමියා

#### අනාවරණ සාහිත්‍ය
1. දානියෙල්

## නව ගිවිසුම

### සුභාරංචි
1. මතෙව්
2. මාර්ක්
3. ලූක්
4. ජොහාන්

#### ඉතිහාස
1. ක්‍රියා පොත

#### සාහිත්‍ය
ජොහාන්තුමාට එළිදරව් වූ දර්ශනය

### හසුන්

#### පාවුල්තුමාගේ ලිපි
1. රෝම
2. i කොරින්ති
3. ii කොරින්ති
4. ගලාති
5. එපිස
6. පිලිප්පි
7. කොලොස්සි
8. i තෙසලෝනික
9. ii තෙසලෝනික
10. i තිමෝති
11. ii තිමෝති
12. තීතස්
13. පිලෙමොන්

#### සාමාන්‍ය හසුන්

##### වෙනත් ලිපි
1. හෙබ්‍රෙව්
2. ජාකොබ්
3. i පේදුරු
4. ii පේදුරු
5. i ජොහාන්
6. ii ජොහාන්
7. iii ජොහාන්
8. ජූද්

**කටපාඩම් කරමු.**
**ගීතාවලිය 119:89**

**ක්‍රියාකාරකම:**

1. පංච පුස්තකය අයත් පොත් 5 සහ ශුභාරංචි හතරේ නම් ඔබේ සටහන් පොතේ ලියා කට පාඩම් කරන්න.

2. ශුද්ධ බයිබල් සැකැස්ම දී ඇති සටහන පංතියේ ප්‍රදර්ශනය කිරීමට විශාල පරිමාණයෙන් ඉදිරිපත් කරන්න. කණ්ඩායම් වලට බෙදී විවිධ අංශ ලියා පාට කර දක්වන්න.